Sannasa
244 Princes Hwy
Hallam Vic 3803 Australia
**Web: www.sannasa.net**
**www.sannasa.com**
email :sannasanews@gmail.com
Tel/Fax :03 9796 4241**after 4pm**

**සංස්කරණය / Editor**
අසෝක සුබසිංහ
Asoka Subasinghe

**සංස්කරණ උපදේශක / Editorial Advisor**
ජගත් ජේ එදිරිසිංහ
Jagath J Edirisinghe

**සහය සංස්කාරක / Asst. Editor**
ශ්‍රීනාත් මද්දුමගේ Srinath Maddumage

**ක්‍රීඩා සංස්කාරක / Sports Editor**
අසෝක සිල්වා Asoka Silva

**රූ රටා / Graphics**
ශානලී එදිරිසිංහ Shanalee Edirisinghe

**වෙළඳ දැන්වීම් / Advertising**
**S Jayasinghe**
03 8707 4604
0402 025 516
**email** ads.sannasa@gmail.com

**Kuma Gamage**
0414 215 280
**email** kuma.sannasa@gmail.com

**Account Details for Payments**

**Bank -** ANZ
**Branch -** 013312
**A/C number -** 254306608
**Name of A/C**
Sannasa News Group

**සන්නස පිරිවර**
සිසිර දිසානායක
වි ක ධර්මබන්ධු
ශ්‍රියාණි මද්දුමගේ
මහින්ද දිසානායක දිවුල්ගනේ

**සේයා රූ / Photography**
Prasanna Kurukularatna

**සම්බන්ධීකරණය**
**NSW**
Lakshman Kodituwakku

**QLD**
Ananada Samaratunga
2, Santorini Pl.
Forest Lake
QLD 4078
(07) 3372 7958

**WA**
Ven Beruwala Sobhitha Thero
Sri Lanka Perth Budhdist Vihara

**ACT**
Asoka Nimalasiri
0400 429 031

**SA**
Chandra Eeriyagama
08 8331 2318

පුවත්පතේ පලවන ලිපිවල අන්තර්ගතය ඒ ඒ ලේඛකයා/ලේඛිකාව ගේ අදහස් වන අතර ඒවායින් සංස්කාරකවරුන්ගේ අදහස් පිළිබිඹු නොවන බව සලකන්න සන්නස නව සහශ්‍රයට පුවත්පතින් උපුටාගත් බව සඳහන් කරමින් ඒවා උපුටා දැක්වීමට අවසර ඇත




## නිමක් නැති අර්බුද

නීතිය හා නීතියේ ආධිපත්‍යය අරහයා මතුවී ඇති අර්බුදය පිළිබඳව පසුගිය කාල සීමාව පුරාම ඇති පදම් කරණු මාධ්‍ය හරහා අපි ලබාගත්තෙමු. දැන් අපි පසුකරමින් සිටින්නේ ඒ උත්තරීතර නීතිය ක්‍රියාත්මක කිරීම සඳහා නිල වශයෙන් බැඳී ඇති ආයතනය හරහා එය ක්‍රියාත්මක කෙරී ඇති ත්‍රාසජනක ආකාරය පිළිබඳ අවබෝධය ලබාගන්නා කාලයයි. අප අසමින් දකිමින් සිටින ඒ අපූරු ජවනිකා පෙළහි ප්‍රධාන තරුව බවට පත්වී ඇත්තේ දීර්ඝ කාලයක් පාතාලයට හා ආණ්ඩුවට එරෙහි බලවේග සම්මත විරෝධී ආකාරයට මර්ධනය කිරීම සඳහා යොදාගන්නා ලද කණ්ඩායමේ ප්‍රාධානියා වූ නියෝජ්‍ය පොලිස්පති වාස් ගුණවර්ධනයි. වාස් අත්අඩංගුවට පත්වූ පසු ඒ ගැන පරීක්ෂණ පවත්වන පොලිස් කණ්ඩායම හා රජයේ මාධ්‍යකරුවන් විශේෂ උනන්දුවකින් කටයුතු කරමින් සිටින්නේ පසුගිය කාලසීමාව තුළ සිදුවූ සියළු අපරාධ හා කප්පම් ගැනීම් ආදී සියල්ල වාස් ගුණවර්ධන ප්‍රමුඛ කල්ලිය විසින් පෞද්ගලික උවමනාවන්ට කරල ලද ඒවා බව ජනතාවට ඒත්තු ගැන්වීමට බව පැහැදැළි වී තිබේ.

ඒ අනුව කහවත්තේ ඝාතනය කුරුණෑගල බෝම්බ ලොරියේ සිද්ධිය පෝද්දල ජයන්තට පහර දීම මැජෙස්ටික් ප්‍රභාගේ අතුරුන් වීම එක්නැළිගොඩගේ අතුරුදන්වීම ආදී සියල්ල කර ඇත්තේ වාස්ගේ අවශ්‍යතාවටය. සත්‍යය නම් වාස් ගුණවර්ධන මේ සියල්ල කළේ තනිවම නොවන බවයි. ඔහු රජයේ ඉතා විශ්වාසවන්ත සගයෙකි. ඔහු ඉටු කළේ රජයේ අවශ්‍යතාවයි. ඔහුගේ සියළු කටයුතු සඳහා ආණ්ඩුවේ අනුමැතිය හා ආශිර්වාදය ලැබී තිබුණි.

ඔහු මේවර කර ඇත්තේ ඔහුට ලබා දී තිබූ සීමාව පැනීම පමණකි. ඒ සීමාව ඔහුගේ ඉරණම තීන්දුකරන බව ඔහු නොදැන සිටියා විය හැකිය.

ගින්දර කන මිනිසුන් දැන සිටියයුත්තේ අඟුරු මළපහ කරන්නට සිදුවන බවය.

වාස් ගුණවර්ධන යනු පුද්ගලයෙක් පමණකි. එහෙත් නීතිය හා පොලීසිය පවතින්නේ සමස්ථ සමාජය උදෙසාය. රජයක් පැවතිය යුත්තේ මේ දෙකම සඳහාය. වැටත් නියරත් ගොයම් කා නම් ඒ අවනඩුව කාට කියන්නද?

## එක්නැළිගොඩ හා අරුන්දික

අනුන්ගේ හදවත්වල දැවෙන ගින්දර වැනි වේදනා සමග සෙල්ලම් කිරීම පාපයක් බව මහජන සේවකයකු වන පුත්තම් මන්ත්‍රී අරුන්දකට තේරුම් ගැනීමට නොහැකිවීම රටේ සාරධර්ම පිරිහීම නැවත වතාවක් පෙන්වාදෙන සිදුවීමකි.

කුමන අරමුණකින් කළද අතුරුදන්වී සිටින මාධ්‍යවේදී එක්නැළිගොඩ ප්‍රංශයේදී හමුවුණා යයි ගල් පැලෙන බොරුවක් කියා පෑ අරුන්දික දෙවැනි වන්නේ මුලු ලෝකය ඉදිරියේම මේ බොරුවම දෙසා බෑ පීරිස් නම් මහතාට පමණකි. මිනීමරුවන්ගේ, ස්ත්‍රී දූෂකයන්ගේ, පගාමරු-වන්ගේ, කුඩුකාරයන්ගේ, බොරුකාරයන්ගේ, බේබද්දන්ගේ, නවාතැන්පලක් වී ඇති ආණ්ඩුවකින් යහගුණදම් බලාපොරොත්තුව සිටීම තරම් මෝඩකමක් තවත් ඇතිද?

සංස්කාරක




# විදුහල්පති කර්නල් තනතුර ගැන කොරනෙල් පරීක්ෂණයක්

අජිත් පැරකුම් ජයසිංහ

දෙමළ බැරි වුණත්, නිකම් දෙනවානම් දෙමළ පත්තරේ වුණත් ගෙදර අරන් යන මිනිස්සු ඉන්න රටේ උපන් තෙකට ව්‍යායාමයක් කරලා නැති විදුහල්පතිවරයෙකු වුණත් නිකම් දෙන කර්නල් තනතුරක් ගන්න කොර්නෙල් පරීක්ෂණයකට පවා මුහුණ දෙන්න යන එක ගැන පුදුම වෙන්න ඕනැ නැහැ.

මගේ ජීවිතේ අවුරුදු දෙකක් මහරගම ගුරු විද්‍යාලේ ගෙවුණා. අල්ලපු වැටේ ජාතික අධ්‍යාපන ආයතනේ පුස්තකාලය තිබුණ නිසා මේ අවුරුදු දෙක සම්පූර්ණයෙන් ම නිෂ්ප්‍රයෝජන වුණේ නැහැ. අපට හිටියා හරි ෂෝක් ගුරු අධ්‍යාපනඥයෝ ටිකක්. එක්කෙනෙක් අවුරුදු දෙකක් අපට ශාරීරික අධ්‍යාපනය ඉගැන්වූවා පංති කාමරයේ, පිට්ටනියක පස් පාගන්නේ නැතිව. මනෝ විද්‍යාව උගන්වපු ගුරු අධ්‍යාපනඥයා අවුරුදු දෙකක් ම පරණ සටහන් පොතක් බලාගෙන සටහනක් කියෙව්වා. එහි ඉංග්‍රීසි අංශ ප්‍රධානි වෙලා හිටපු මැඩම් නම් ටිකක් යමක් කමක් දන්න කෙනෙක්. හැබැයි, එයාට ඔය අධ්‍යාපනඥ පට්ටම තිබුණෙ නැහැ. මේකෙ තව හාදයෙක් මුළු අවුරුදු දෙකම කළේ මිනිහා තමයි සුදුස්සා, ඒ වුණාට

4 වන පිටට